## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2.1 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 7 (1) වගන්තියේ විධිවිධානයන්වලට අනුව අනිවාර්ය දායක මුදල මෙන් 1.5 ගුණයක් රජය විසින්, රජයේ ප්‍රසාද මුදල් ලෙස අරමුදලට බැරකල යුතු වේ. 2012 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය දායක මුදලේ වූ රු.12,954,988,371 ක ශේෂය මෙන් 1.5 ගුණයක් වූ රු.19,432,482,557 ක් රජයේ ප්‍රසාද මුදල් ගිණුමේ තිබිය යුතු වුවත්, එහි ශේෂය රු.19,839,373,184 වුයෙන් රු.406,890,628 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස පැහැදිලි කිරීමට අවශ්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කළමනාකරණය අපොහොසත් විය.

(ආ) පනතේ 2 (2) වගන්තිය ප්‍රකාරව, එක් එක් දායකයා වෙනුවෙන් කේවල ගිණුම් පවත්වා ගත යුතු වුවත්, අරමුදල ආරම්භයේ සිටම කේවල ගිණුම පවත්වා ගැනීමට කටයුතු කර නොතිබූ හෙයින්, අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය වූ රු.12,954,988,371 ක මුදල පරීක්ෂා කිරීමට නොහැකි විය.මීට අමතරව අරමුදලට අනිවාර්ය දායක ගෙවීම සිදු කරන දායකයින් සම්බන්ධව විස්තර නොමැති වීම හා ලැබිය යුතු හිඟ ශේෂයන්ද ගණනය කර නොතිබීම හේතුවෙන් අනිවාර්ය දායක මුදල් ගිණුමේ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂ පත්‍රයේ ගැලපුම් ගිණුමේ රු.13,823,857 ක ශේෂයක් දක්වා තිබුණි. මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබු අතර පසුගිය වර්ෂ කිහිපයක පැවැති ශේෂයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| වර්ෂය | ශේෂය |
|---|---|
| | (රු.) |
| 2009 | 5,983,197 |
| 2010 | 12,850,740 |
| 2011 | 18,326,537 |

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකරන ලද වැරදි හර රු.13,909,679 හා වැරදි බැර රු.85,822 ක් විය. මෙයින් 2009 හා ඊට පෙර හර ශේෂවල එකතුව රු.5,552,334 ක් විය.

## 1.2.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන්අනුකූලනොවීම්නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) රාජ්‍ය සේවා අර්ථසාධකඅරමුදල්ආඥා පනතේ (621 අධිකාරය) | |
| (I) 2 (2) වගන්තිය | එක් එක් දායකයා වෙනුවෙන් කේවල ගිණුම් පවත්වා ගත යුතු වුවත්, අරමුදලේ ආරම්භයේ සිටම කේවල ගිණුම පවත්වා නොතිබුණි. |
| (II) 25 වගන්තිය | මෙම වගන්තිය ප්‍රකාර එක එක් මුදල් වර්ෂය අවසන් වීමෙන පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුත වුවත්,ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 188 (2) | 2012 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුමෙහි මාස 06 කාලය ඉක්මවූ උපලබ්ධි නොවූ රු.193,720 ක් වූ ලැබීම් විධිවිධාන ප්‍රකාරව නිරවුල් කරවා ගැනිමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය දායකයන් වෙත විසර්ජනයට පෙර රු. 2,560,334,257 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,426,308,059ක වූයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයේ රු. 134,026,198 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු.134,821,502 කින් හෙවත් සියයට 6 කින් ඉහළයාම අතිරික්තයේ වර්ධනයට හේතුවී ඇති බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

2012 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්ම අනුව අරමුදලේ ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ඉලක්කයන් හා තථ්‍ය සපුරාලීම් තත්ත්වය පහත දැක්වේ.

| | ක්‍රියාකාරකම | අපේක්ෂිත ඉලක්ක | 2012 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|
| | | | තථ්‍ය තත්ත්වය | ප්‍රතිශතය |
| | | | | සියයට |
| (අ) | දායකයින් ලියාපදිංචි කිරීම | 6,000 | 3,667 | 61 |
| (ආ) | දායක මුදල්එකතුකිරීම (රු.මි.) | 2,200 | 1,556 | 71 |
| (ඇ) | අමතර මුදල් ආයෝජනය (රු.මි) | 3,400 | 3,420 | 114 |
| (ඈ) | දායකයින්ටප්‍රතිලාභ ගෙවීම (රු.මි) | 500 | 484 | 97 |

## 3.2 සාමාජිකයන්ට හිමිවූ පොලී ප්‍රතිශතය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේදී අරමුදල මඟින් සාමාජිකයන්ට හිමිකර දී තිබූ පොලී ප්‍රතිශතයන් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|
| | සියයට | සියයට | සියයට | සියයට | සියයට | සියයට | සියයට |
| පොලී ප්‍රතිශතය | 8.69 | 9.15 | 11.00 | 11.85 | 7.95 | 7.50 | 8.04 |

ඉහත දක්වා ඇති විස්තර අනුව වාර්ෂිකව සාමාජිකයින්ට ගෙවූ පොලී ප්‍රතිශතයේ උච්චාවචනයක් සිදුවී තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සාමාජිකයන්ට ගෙවූ පොලී ප්‍රතිශතය සියයට 0.55 කින් අඩුවී තිබුණි.

මුදල් වෙළඳපොලෙහි පවතින පොලී අනුපාතයන්ගේ උච්චාවචනයේදී අරමුදලේ ආයෝජනය සඳහා ලැබෙන පොලී ප්‍රමාණයන්ද වෙනස් වන හෙයින් විසර්ජනය කරන ලද පොලී අනුපාතයන්ගේ උච්චාවචනය සිදු වන බවත් විගණනයේදී වැඩිදුරටත් අනාවරණය විය.

## 3.3 භාණ්ඩාගාරයෙන් අරමුදලට ලැබිය යුතු මුදල්

භාණ්ඩාගාර ලේකම් වෙතින් අයවිය යුතු රජයේ ප්‍රසාද මුදල්, අරමුදල වෙත නොලැබීම හේතුවෙන් එම මුදල් ආයෝජනය කිරීම මගින් උපයාගත හැකිව තිබුණ පොලී ආදායම් අහිමි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 6 ට අදාලව එසේ අහිමි වී ඇති පොලී ආදායම පහත පරිදිවේ.

| වර්ෂය | භාණ්ඩාගාරය වෙතින් ලැබිය යුතු මුදල දෙසැම්බර් 31 දිනට | ලැබිය යුතු මුදල භාණ්ඩාගාරබැඳුම්කරවල ආයෝජනය කිරීම මත ඉපැයීමට හැකිවතිබුණු පොලිය |
|---|---|---|
| | රු. | රු. |

| | | |
|---|---|---|
| 2006 | 1,013,381,581 | 154,034,000 |
| 2007 | 1,451,131,498 | 206,060,673 |
| 2008 | 1,799,238,475 | 307,669,779 |
| 2009 | 1,792,715,215 | 277,870,858 |
| 2010 | 1,904,165,223 | 166,614,457 |
| 2011 | 2,147,647,821 | 186,201,066 |
| 2012 | 2,127,765,493 | 170,221,239 |
| | | 1,468,672,072 |

ඉහත නිරීක්ෂණ අනුව ආසන්න වර්ෂ 06 තුළ පමණක් අරමුදලට අහිමි වී ඇති ආයෝජන පොළී ආදායම දළ වශයෙන් රුපියල් මිලියන1,468 ක් වී තිබුණි.

## 3.4 සාමාජිකයින් වෙත ප්‍රතිලාභ ගෙවීම.

සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අයදුම්කළ අයදුම්පත්‍ර අතරින් අයදුම්පත් 557ක් සඳහා 2012 දෙසැම්බර් 31 දින වන විට ගෙවීම්කර නොතිබුණු අතර එය මුළු සංඛ්‍යාවෙන් සියයට 8 ක් විය. සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ කිහිපයට අදාල තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වර්ෂයේ ගෙවීමට තිබූ අයදුම්පත්‍ර සංඛ්‍යාව | වර්ෂය තුළ ගෙවීම් කළ අයදුම්පත් සංඛ්‍යාව | වර්ෂය තුළ ගෙවීම් නොකළ අයදුම්පත් සංඛ්‍යාව | වර්ෂය තුළ ගෙවීම් නොකළ අයදුම්පත් සංඛ්‍යාවේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | | | % |
| 2006 | 1,103 | 622 | 481 | 43.6 |
| 2007 | 2,432 | 1,776 | 656 | 27.0 |
| 2008 | 4,014 | 3,289 | 725 | 18.1 |
| 2009 | 6,151 | 4,194 | 1,957 | 31.8 |
| 2010 | 9,787 | 5,882 | 3,905 | 39.9 |
| 2011 | 11,608 | 9,836 | 1,772 | 15.3 |
| 2012 | 7,402 | 6,845 | 557 | 8.0 |

## 3.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

1997 ජූලි 31 දිනැති අංක 1/97 සහ 2006 ඔක්තෝබර් 30 දිනැති අංක 14/2006 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ප්‍රකාරව සෑම මාසයක් තුළම අරමුදලට බැර කරනු ලබන මුදල් පිළිබඳ නිවේදනයක් ඊලග මාසයේ 15 දිනට පෙර අරමුදලේ ලේකම් වෙත අදාල ආයතන විසින් එවිය යුතු වුවත්, 2012 වර්ෂය සඳහා මෙම නිවේදන එවා තිබුණේ ආයතන කිහිපයකින් පමණි. එම නිවේදන ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් අරමුදල ගෙනතිබූ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා වී නොතිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අවකරණ ලේඛන ලබාගැනීම

(ඇ) දායක මුදල් ගෙන්වා ගැනීම